කාර්යසාධන වාර්තාව 2021

செயலாற்றுகை அறிக்கை 2021

Performance Report 2021

ශීර්ෂය - 102

මුදල් අමාත්‍යාංශය

தலைப்பு - 102

நிதி அமைச்சு

Head - 102

Ministry of Finance





කාර්යසාධන වාර්තාව

2021

ශීර්ෂය - 102

මුදල් අමාත්‍යාංශය

2021 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව

මුදල් අමාත්‍යාංශය

වැය ශීර්ෂ අංකය: 102

01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය 3

02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම 9

03 පරිච්ඡේදය - 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය 11

04 පරිච්ඡේදය - කාර්යසාධන දර්ශක 17

05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය 18

06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ 19

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව 20

01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

මුදල් අමාත්‍යාංශය ශ්‍රී ලංකාවේ ප්‍රධානතම කැබිනට් අමාත්‍යාංශයකි.

එමඟින් රටේ ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීම තහවුරු කරනු වස් ආයෝජනය සහ ආර්ථික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම උදෙසා රටෙහි ආර්ථික සහ මූල්‍ය ප්‍රතිපත්ති නිර්මාණය, යෝජනා කිරීම සහ ඇගයීම ප්‍රධානම වශයෙන් සිදු කෙරේ.

මේ වන විට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අග්‍රාමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා මුදල් අමාත්‍යවරයා ලෙස කටයුතු කරන අතර එස්. ආර්. ආටිගල මහතා මුදල් අමාත්‍යාංශ ලේකම් ලෙස කටයුතු කරනු ලැබේ.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

“කඩිනම් සංවර්ධනය සහ ආයෝජනය සඳහා පහසුකම් සලසන ආර්ථික පසුබිමක් තුළින් නව ශ්‍රී ලංකාවක්”

මෙහෙවර

“මහජනතාවට උසස් ජීවන තත්ත්වයක් ලබාදෙන බවට සහතික වීම පිණිස ආයෝජනය සහ ආර්ථික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම උදෙසා කාර්යක්ෂම ලෙස හා විනිවිද භාවයෙන් යුක්තව රටේ ආර්ථික හා මූල්‍ය ප්‍රතිපත්ති නිර්මාණය කිරීම, යෝජනා කිරීම, ක්‍රියාත්මක කිරීම සහ ඇගයීම.”

අරමුණු

- රටේ ජාතික ආර්ථික හා මූල්‍ය ප්‍රතිපත්ති හා උපාය මාර්ග සකස් කිරීම.
- රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති සකස් කිරීම හා සාර්ව මූල්‍ය ප්‍රතිපත්ති කළමනාකරණය.
- ජාතික සංවර්ධන සැලසුම සකස් කිරීම හා මූල්‍ය සම්පත් කළමනාකරණය.
- ජාතික බදු ප්‍රතිපත්තිය කළමනාකරණය හා රාජ්‍ය ආදායම ඵලදායී ලෙස භාවිතා කිරීම.
- ශ්‍රී ලංකා මහ බැංකුව හා සම්බන්ධීකරණය කරමින් මූල්‍ය ප්‍රතිපත්ති සකස් කිරීම.

- රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම හා ආර්ථික සංවර්ධනය සඳහා පෞද්ගලික අංශයට පහසුකම් සැලසීම.
- ජාත්‍යන්තර නියෝජිතායතන සමඟ සම්බන්ධීකරණය සිදුකිරීම හා ඵලදායී භාවිතය තහවුරු කරමින් විදේශ සම්පත් සංවලිකරණය.
- ඒකාබද්ධ අරමුදල පවත්වාගෙන යාම හා ඒ සඳහා ගිණුම්ගත කිරීම හා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව රටේ වාර්ෂික ගිණුම් ප්‍රකාශයට පත් කිරීම.

1.3 ප්‍රධාන කාර්යයන්

- මූල්‍ය හා බදු ගණනය විෂයයට සම්බන්ධ දෙපාර්තමේන්තු ව්‍යවස්ථාපිත ආයතන සහ රාජ්‍ය සංස්ථා යටතට ගැනෙන එකී විෂයන්හි ප්‍රතිපත්ති සහ වැඩසටහන් සකස් කිරීම අධීක්ෂණය සහ ඇගයීම.
- සාර්ව මූල්‍ය කළමනාකරණ හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති සකස් කිරීම.
- මූල්‍ය සම්පත් කළමනාකරණය සහ වාර්ෂික අයවැය පිළියෙල කිරීම.
- අයවැය පිළිබඳ මූල්‍ය පාලනය බලාත්මක කිරීම සහ ජාතික අයවැය ක්‍රියාත්මක කිරීම.
- රජයේ ආදායම් ඵලදායී ලෙස භාවිතා කිරීම සහ ජාතික බදු ප්‍රතිපත්ති කළමනාකරණය කිරීම.
- රජයේ මූල්‍ය රෙගුලාසි බලාත්මක කිරීම.
- ඒකාබද්ධ අරමුදල කළමනාකරණය.
- රාජ්‍ය වියදම් කළමනාකරණය.
- රජයේ ප්‍රසම්පාදන උපදේශාත්මක සේවා.
- දෙපාර්තමේන්තු සහ අනෙකුත් රාජ්‍ය මුදල් පාලනය කිරීම.
- රාජ්‍ය ගිණුම් කාරක සභාවේ වාර්තා මත පදනම් වූ භාණ්ඩාගාර රැස්වීම් වාර්තා පවත්වාගෙන යාම.
- දෙපාර්තමේන්තු වල කළමනාකරණ විගණනය උසස් කිරීම සඳහා මාර්ගෝපදේශ සකස් කිරීම.
- සේවක සංඛ්‍යා කළමනාකරණය.
- ආයතන වලට පවරනු ලද අනෙකුත් සියලුම විෂයයන්ට සම්බන්ධ කරුණු.
- ආයතන අධීක්ෂණය.


මුදල් අමාත්‍යාංශයේ ලේකම්/මහා භාණ්ඩාගාරයේ ලේකම්
භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්
භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්
භාණ්ඩාගාරයේ දෙපාර්තමේන්තු
භාණ්ඩාගාරයේ දෙපාර්තමේන්තු
අතිරේක ලේකම්
අධ්‍යක්ෂ ජනරාල් (ආයතනික කටයුතු)
අභ්‍යන්තර විගණන ප්‍රධානී
ප්‍රධාන මූල්‍ය නිලධාරී
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන)
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාර්ලිමේන්තු කටයුතු හා මාධ්‍ය)
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (රාජ්‍ය ව්‍යාපාර හා ව්‍යාපෘති)
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ප්‍රසම්පාදන හා අරමුදල්) (ශ්‍රී.ලං.ග.සේ)
ප්‍රධාන අභ්‍යන්තර විගණක (අමාත්‍යාංශය)
ප්‍රධාන අභ්‍යන්තර විගණක (භාණ්ඩාගාර දෙපාර්තමේන්තු)
ප්‍රධාන ගණකාධිකාරී
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පරිපාලන)
අධ්‍යක්ෂ (ඉංජිනේරු)
අධ්‍යක්ෂ (සුභසාධන) ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවය
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්
අධ්‍යක්ෂ (ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවය)
අධ්‍යක්ෂ (අරමුදල්) ශ්‍රී ලංකා පරිපාලන සේවය
අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන) ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය
ගණකාධිකාරී (ගෙවීම්)
ගණකාධිකාරී (මූල්‍ය)
ගණකාධිකාරී (සැපයුම්)
සහකාර ලේකම් (මානව සම්පත්)
සහකාර ලේකම් (පරිපාලන)
සහකාර ලේකම් (ආදායම්)
ස.අ/නි.අ (ඉංජිනේරු)
ස.අ/නි.අ (ශ්‍රී.ලං.පරිපා සේ)
ස.අ/නි.අ (ශ්‍රී.ලං.ක්‍ර.සේ)
ස.අ/නි.අ (ශ්‍රී.ලං.ක්‍ර.සේ)
ස.අ/ස.ලේ (අ.ම.ස)
ස.අ. (පාර්ලිමේන්තු
ස.අ/නි.අ (ශ්‍රී.ලං.ග.සේ)
ස.අ/නි.අ (ශ්‍රී.ලං.ග.සේ)
ස.අ/නි.අ (ශ්‍රී.ලං.ක්‍ර.සේ)
නි.අ. (ශ්‍රී.ල. ග.සේ
නි.අ. (ශ්‍රී.ල. ග.සේ
ස.අ. (ශ්‍රී.ලං.පරි සේ)
ස.අ. (ශ්‍රී.ලං.පරි සේ)
ස.අ. (ශ්‍රී.ලං.ග. සේ)
ස.අ. (ශ්‍රී.ලං.ග.සේ)
පරිපාලන නිලධාරී
පරිපාලන නිලධාරී
කො.ස.නා නිලධාරී
පරිචර්තක
සං.නි/ ක.සේ.නි
සං.නි/ ක.සේ.නි
සං.නි/ ක.සේ.නි
සං.නි/ ක.සේ.නි
සං.නි/ ක.සේ.නි
සං.නි/ ක.සේ.නි
සං.නි/ ක.සේ.නි
සං.නි/ ක.සේ.නි
සං.නි/ ක.සේ.නි
සං.නි/ ක.සේ.නි
සං.නි/ ක.සේ.නි
සං.නි/ ක.සේ.නි
කා.ක.ස
කා.ක.ස
කා.ක.ස
කා.ක.ස
කා.ක.ස
කා.ක.ස
කා.ක.ස
කා.ක.ස
කා.ක.ස
කා.ක.ස
කා.ක.ස
කා.ක.ස

	භාණ්ඩාගාර කටයුතු
01	මහා භාණ්ඩාගාරය
02	රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
03	ජාතික අයවැය දෙපාර්තමේන්තුව
04	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව
05	විදේශ සම්පත් දෙපාර්තමේන්තුව
06	රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව
07	භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
08	රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
09	වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
10	තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව
11	නීති කටයුතු දෙපාර්තමේන්තුව
12	කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව
13	සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව
14	රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

	රාජ්‍ය ආදායම් කළමනාකරණ කටයුතු
01	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
02	ශ්‍රී ලංකා රේගුව
03	සුරාබදු දෙපාර්තමේන්තුව
04	ජාතික ලොතරැයි මණ්ඩලය
05	සංවර්ධන ලොතරැයි මණ්ඩලය
06	ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව
07	බදු අභියාචනා කොමිෂන් සභාව

	බැංකු මූල්‍ය හා ප්‍රාග්ධන වෙළඳපල ප්‍රතිපත්ති හා නියාමන කටයුතු
01	ශ්‍රී ලංකා මහ බැංකුව
02	සියලුම රාජ්‍ය බැංකු, මූල්‍ය, රක්ෂණ හා ඒවායේ පාලිත සමාගම් හා ආයතන I. නිවාස සංවර්ධන මූල්‍ය බැංකුව II. ලංකා බැංකුව III. මහජන බැංකුව IV. ජාතික ඉතිරි කිරීමේ බැංකුව V. ප්‍රාදේශීය සංවර්ධන බැංකු VI. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව VII. නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව VIII. ලංකා පුත්‍ර සංවර්ධන බැංකුව
03	ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව
04	ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව හා එහි පාලිත සමාගම් සහ අනුබද්ධ සමාගම්

05	ණය තොරතුරු කාර්යාංශය
06	සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව
07	ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව
08	ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව

	ඇවර කිරීමට හෝ වෙනත් ආයතන සමඟ ඒකාබද්ධ කිරීමට නියමිත ආයතන
01	විදුලි සංදේශ දෙපාර්තමේන්තුව
02	වනජීවී භාරය
03	ශ්‍රී ලංකා ජනමාධ්‍ය අභ්‍යාස ආයතනය
04	අභ්‍යන්තර වෙළඳ දෙපාර්තමේන්තුව
05	මාංශ භෝග හා ධාන්‍ය පර්යේෂණ සහ නිෂ්පාදන අධිකාරිය
06	සීමාසහිත ජනතා ෆර්ටිලයිසර් එන්ටර්ප්‍රයිසස්
07	දරුවන් සුරකිමු ජාතික භාර අරමුදල

1.6 අමාත්‍යාංශය යටතේ පවතින අරමුදල්

	අරමුදල් කළමනාකරණය
01	ලෝහෝර් ආර්යා අරමුදල
02	වර්ජන කෝලාහල, සිවිල් කලබල හා ත්‍රස්තවාදය පිළිබඳ අරමුදල
03	ජාතික රක්ෂණ භාර අරමුදල
04	සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල
05	ශ්‍රම වාසනා අරමුදල
06	ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල
07	වකුගඩු අරමුදල
08	තේ ශක්ති අරමුදල
09	කප්රුක අරමුදල
10	රාජ්‍ය සේවා විශ්‍රාමිකයන්ගේ භාරකාර අරමුදල
11	සීමාසහිත නිපුණතා සංවර්ධන අරමුදල
12	දේශීය ණය සහ සංවර්ධන අරමුදල
13	නිමැයුම්කරුවන්ගේ අරමුදල
14	තුරුසවිය අරමුදල

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්)

අ) ව්‍යාපෘතියේ නම

ආ) දායක නියෝජිතායතනය

ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත වියදම - රු. මී.

ඈ) ව්‍යාපෘති කාල සීමාව

	(අ) ව්‍යාපෘතියේ නම	(ආ) දායක නියෝජිතායතනය	(ඇ) ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම - රු. මී.	ව්‍යාපෘති කාල සීමාව
01	සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතිය (SSNP)	ලෝක බැංකුව	ඇමෙරිකන් ඩොලර් මිලියන 75	අවුරුදු 02
02	මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතිය(FSMP)	ලෝක බැංකුවේ ජාත්‍යන්තර සංවර්ධන සමායතනය (IDA)	-	අවුරුදු 05

විශේෂ ජයග්‍රහණ, අභියෝග හා ඉදිරි ඉලක්ක

කොවිඩ් - 19 හේතුවෙන් කඩාවැටුණු රටේ ආර්ථිකය නැවත ගොඩනගමින් අනෙකුත් බොහෝමයක් රටවලට සාපේක්ෂව රෝගය පාලනය කිරීම අතිසාර්ථකව සිදු කිරීම මෙම වසරේදී ලද විශේෂිතම ජයග්‍රහණය වේ.

ගෝලීයව සිදු වූ සංක්‍රමණික කටයුතු ඇණහිටීම හේතුවෙන් පසුගිය වසරේදී සංචාරක කර්මාන්තයේ විශාල බිඳවැටීමක් සිදු වූ නමුත් මෙම වසරේ අගභාගය වන විට විදේශික සංක්‍රමණිකයන්ගේ සැලකිය යුතු ඉහළ යාමක් දක්නට ලැබුණි.

රටට විදේශ විනිමය ගලා ඒමේ මාර්ගයන් අවහිර වීමත් සමඟ ආහාර, ඖෂධ හා ඉන්ධන වැනි රටට අත්‍යාවශ්‍ය භාණ්ඩ පමණක් ආනයනය කරමින් රටෙහි විදේශ විනිමය සංචිතය විවක්ෂණශීලීව භාවිතා කරන ලදී.

ප්‍රධාන ප්‍රතිපත්තිමය තීරණ

- රජය සතු ව්‍යාපාර වල මානව සම්පත් සම්බන්ධයෙන් දිගුකාලීනව නොවිසඳී පවතින ගැටලු නිරාකරණය කර ගනිමින් සංවර්ධන කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා පද්ධතීන් හා ක්‍රියාවලීන් සරල කරමින් ප්‍රධාන නියාමන ආයතන සහ රජය සතු ව්‍යාපාරවල ධාරිතාව දියුණු කිරීම සඳහා කමිටු පිහිටුවීම.
- ශ්‍රී ලංකා කොවිඩ් -19 හදිසි හා අර්බුද ප්‍රතිචාර දැක්වීමේ පහසුකම යටතේ ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව(AIIB) සමඟ එළඹී ගිවිසුම් මඟින් එන්නත්, ප්‍රතිදේහජනක පරීක්ෂණ කට්ටල, PET කට්ටල වැනි කොවිඩ් - 19 සඳහා අවශ්‍ය කරන ඖෂධ හා උපාංග ලබා ගැනීම.
- කොවිඩ් වසංගතය මර්ධනය කිරීම සඳහා 2021 වර්ෂය තුළ රජය කොවිඩ් වසංගතය ආශ්‍රිත වියදම් වෙනුවෙන් රුපියල් බිලියන 210 ක මුදලක් වෙන් කිරීම.(ඒ අනුව කොවිඩ් 19 වෛරස් තත්වය පාලනය උදෙසා වයස අවුරුදු 12න් ඉහළ සියළු පුරවැසියන් සඳහා එන්නත්කරණ වැඩසටහන දීප ව්‍යාප්තව සාර්ථකව සිදු කර ඇත. තවද, මේ වන විට 95% ක් පළමු එන්නත් මාත්‍රාවද, 80% ක් පළමු හා දෙවන එන්නත් මාත්‍රාවන්ද, 46% ක් පළමු දෙවන හා තෙවන එන්නත් මාත්‍රාවන්ද, ලබා දීමට පහසුකම් සලසා දී ඇත.)
- උද්ගත වූ කොවිඩ් - 19 වසංගත තත්වය යටතේ පීඩාවට පත් ජනතාව මුහුණ පා ඇති ආර්ථික දුෂ්කරතාවයන් මහහරවා ගැනීම උදෙසා මෙන්ම රට වසා දැමීම හේතුවෙන් ජීවනෝපාය අහිමි වූ පවුල් සඳහා රුපියල් 5,000/-ක හා රු. 2,000/-ක වශයෙන් දීමනාවන් ලබා දීම.
- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් දිරිගන්වමින් ඔවුන්ගේ ව්‍යාපාරයන් ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය ණය පහසුකම් ඉතා පහසුවෙන් ලබා ගැනීමට සහාය වීම සඳහා ජාතික ණය සුරැකුම් ආයතනයක් ස්ථාපිත කිරීම.
- අතිගරු ජනාධිපතිතුමාගේ "සෞභාග්‍යයේ දැක්ම" සංකල්පය මඟින් පුනර්ජනනීය බලශක්තිය භාවිතයෙන් දැනට රටේ පවතින බලශක්ති අර්බුදය සඳහා විසඳුම් සෙවීමේ එක් පියවරක් වශයෙන් වහල මත සවි කරන සූර්ය බලශක්ති ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ඉන්දියානු අපනයන - ආනයන බැංකුව මඟින් ශ්‍රී ලංකා රජය වෙත ඇමරිකානු ඩොලර් මිලියන 100ක ණය මාලාවක් ලැබීම.

- අනුරාධපුර දිස්ත්‍රික්කයේ කාබනික වගා ක්‍රමය යටතේ කෝමාරිකා ශාකය වගා කර අපනයනය සඳහා ඖෂධීය නිෂ්පාදනයන් කිරීමට සීමාසහිත අචුරා ලංකා හර්බල්ස් පුද්ගලික සමාගම වෙත දීර්ඝ කාලීන බදු පදනම මත අක්කර 66ක් පමණ රජයේ ඉඩම් ලබා දීම සහ ඇමරිකානු ඩොලර් මිලියන 783ක් එම සමාගම විසින් දේශීය ආර්ථිකයට ආයෝජනය සඳහා ඉඩ සැලසීම.

- දැනට රේගු කාර්යයන් සඳහා පවතින ක්‍රමය තවදුරටත් වැඩි දියුණු කරමින් අවම කාලයක් තුළ සේවයේ සැපයීමේ අපේක්ෂාව ඇතිව රැපිස්කෑන් සිස්ටම්ස් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය විසින් ස්ථාපනය කරන ලද බහාලුම් පරිලෝකන පද්ධතිය පූර්ණ වශයෙන් මිල දී ගැනීම.

- "සැමට ජලය" රජයේ තුන් අවුරුදු ඉලක්කය ඉටුකර ගැනීම සඳහා 2021 වර්ෂය තුළ 200,000කට ආසන්න නිවාස ප්‍රමානයකට නලජල සැපයුම් ලබා දීමට සමගාමීව ප්‍රජා පානීය ජල ව්‍යාපෘති, ජලාශ හා මූලාශ්‍ර දියුණු කිරීම සඳහා රුපියල් මිලියන 5,000ක අතිරේක ප්‍රතිපාදන වෙන් කිරීම.

- මීරිගම සිට කුරුණෑගල දක්වා අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු අවසන් කිරීම.

- සෑම ගමක්ම ආවරණය වන පරිදි මාර්ග ලක්ෂයේ වැඩසටහන යටතේ ග්‍රාමීය මාර්ග කිලෝමීටර් 50,000ක් ඉදිකිරීම සඳහා රුපියල් මිලියන 20,000ක අතිරේක ප්‍රතිපාදන වෙන් කිරීම.

- දුෂ්කර ගම්මාන 12,000ක් අවට පරිසරය හා සම්බන්ධ කිරීම ඉලක්ක කරගනිමින් කුඩා වාහන වලට ප්‍රවේශ විය හැකි ග්‍රාමීය පාලම් 10,000ක් ඉදිකිරීමේ වැඩසටහන කඩිනම් කිරීම සඳහා රුපියල් මිලියන 7,000ක් වෙන් කිරීම.

- ග්‍රාමීය රෝහල්, ඩිස්පෙන්සරි, මාතෘසායන වැඩිදියුණු කිරීම සඳහා රුපියල් මිලියන 5,000ක් වෙන් කිරීම.

- සමෘද්ධිලාභී පවුල් ලක්ෂ දෙකක් කේන්ද්‍ර කරගත් අංග සම්පූර්ණ ගෘහ නේවාසික ආර්ථිකයන් හා ආශ්‍රිත ගම්මාන බලපන්න කිරීම සඳහා රුපියල් මිලියන 10,000ක ප්‍රතිපාදන වෙන් කිරීම.

- ඉවතලන කැලිකසල වනජීවී ප්‍රදේශ ආශ්‍රිත ප්‍රදේශවල දැමීම නිසා වන අලින් ගම්වලට ආකර්ෂණය වීම වලක්වා ගැනීම සඳහා ප්‍රාදේශීය සභාවල කැලිකසල කළමනාකරණය සඳහා රුපියල් මිලියන 3,000ක ප්‍රතිපාදන වෙන් කිරීම.

- කොළඹ වරාය නගර විශේෂ ආර්ථික කලාපය ආකර්ශණීය ව්‍යාපාර මධ්‍යස්ථානයක් කිරීමට අවශ්‍ය කටයුතු ආරම්භ කිරීම.

- "ගමට සන්නිවේදනය" වැඩසටහන යටතේ රටම ආවරණය වන පරිදි අන්තර්ජාල සබඳතා ලබා දීම සඳහා ටෙලිකොම් සංවර්ධන අරමුදල සඳහා රුපියල් මිලියන 15ක ආයෝජනයක් සිදු කිරීම.

- භාණ්ඩාගාරයේ/ මුදල් අමාත්‍යාංශයේ ප්‍රධාන දෙපාර්තමේන්තු ස්වයංක්‍රීය කරන ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ පද්ධතියක් (ITMIS) ක්‍රියාත්මක කිරීම සහ ආදායම් පරිපාලනයේ ඒකාබද්ධ භාණ්ඩාගාර මෙහෙයුම් වල නිසි හා ඵලදායී කළමනාකරණයක් පවත්වාගෙන යාම. රජයේ වියදම් සැලසුම් කිරීම, අයවැය කරනය, ආදායම් කළමනාකරණය හා විගණනය ආවරණය කරමින් රට තුළ ප්‍රගස්ථ රාජ්‍ය මූල්‍ය කළමනාකරණයේ සමස්ථ ජීවන චක්‍රය සපුරාලීම සඳහා තනි සහ ඒකාබද්ධ තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීම මෙයින් අරමුණු කර ඇත.)

ලේකම්,
මුදල් අමාත්‍යාංශය

කේ.එම්.එම්. සිරිවර්ධන
මහා භාණ්ඩාගාරයේ සහ මුදල් අමාත්‍යාංශයේ ලේකම්
මුදල් අමාත්‍යාංශය
මහලේකම් කාර්යාලය
කොළඹ 01.

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

එස්ජේ-එම්

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2021 රු.		සටහන	තක්සේ 2021 රු.	නැවත ඇලපන ලද 2020 රු.	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	එස්ජේ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		2,416,228,000.00	1,391,263,162.56	එස්ජේ-3
-	නැන්පතු		543,340,272.94	109,414,968.19	එස්ජේ-4
-	අත්තිකාරම් ගිණුම්		41,189,329.41	55,103,594.91	එස්ජේ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		23,394,345.93	118,598,205.80	
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		3,024,151,948.28	1,674,379,931.46	
-	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		3,024,151,948.28	1,674,379,931.46	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		161,567,576.62	-	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		2,862,584,371.66	1,674,379,931.46	
	අඩු කළා : වියදම්				
-	පුනරාවර්තන වියදම්				
342,400,000.00	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	279,281,464.54	376,950,987.06	
1,251,873,300.00	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	580,795,621.14	475,559,730.07	එස්ජේ-2(ii)
974,385,000.00	යහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	894,669,163.24	158,816,650.23	
-	පොළී ගෙවීම්	8	-	-	
391,700.00	වෙනත් පුනරාවර්තන වියදම්	9	391,664.53	-	
2,569,050,000.00	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		1,755,137,913.45	1,011,327,367.36	
	මූලධන වියදම්				
143,903,000.00	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	127,221,474.21	20,300,795.25	
158,750,000.00	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	105,647,343.74	328,296,912.09	
184,450,000.00	ප්‍රාග්ධන මාරුකිරීම්	12	83,624,125.80	528,499,983.85	එස්ජේ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
43,282,000.00	හැකියා වර්ධනය	14	9,245,747.93	503,700.00	
1,414,800,000.00	වෙනත් මූලධන වියදම්	15	1,202,865,023.36	35,959,060,852.51	
1,945,185,000.00	මුළු මූලධන වියදම් (උ)		1,528,603,715.04	36,836,662,243.70	
	නැන්පතු ගෙවීම්		439,492,016.42	118,933,424.85	එස්ජේ-4
	අත්තිකාරම් ගෙවීම්		29,645,981.77	71,867,259.38	එස්ජේ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		469,137,998.19	190,800,684.23	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		3,752,879,626.68	38,038,790,295.29	
	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		(890,295,255.02)	(36,364,410,363.83)	
	අඟම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		(890,295,255.02)	(36,364,410,363.83)	එස්ජේ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	එස්ජේ-3
			(890,295,255.02)	(36,364,410,364)	

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-පී

2021 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	2021 රු.	2020 රු.
		රුපය	
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	14,404,783,731.21	14,323,396,780.37
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	137,881,173.49	98,974,072.23
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3		-
මුළු වත්කම්		**14,542,664,904.70**	**14,422,370,852.60**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		(148,612,949.56)	(33,221,345.40)
දේපළ පිරියත හා උපකරණ සංචිතය		14,404,783,731.21	14,323,396,780.37
කුලී හා වෑඛ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5(බී)	68,877,948.90	18,427,500.00
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසිඒ-4	217,616,174.15	113,767,917.63
අග්‍රිම ශේෂය	ඒසිඒ-3		-
මුළු වගකීම්		**14,542,664,904.70**	**14,422,370,852.60**

පිටු අංක 1 සිට 73 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 74 සිට 82 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහි අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මේහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලනාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
නම :	නම :	අධ්‍යක්ෂ (මුදල්)/ කොමිසාරිස් (මුදල්)
තනතුර :	තනතුර :	නම :
දිනය :	දිනය : 24/2/22	දිනය : 2022.02.24
ඩබ්ලිව්. ආර්. ආටිගල	ඒවී. පී. සුමනසිංහ	ඒකේ. ආර්. බාලසූරිය
මුදල් අමාත්‍යාංශය	අතිරේක ලේකම්	ප්‍රධාන මූල්‍ය නිලධාරි
මහලේකම් කාර්යාලය	මුදල් අමාත්‍යාංශය	මුදල් අමාත්‍යාංශය
කොළඹ 01.		කොළඹ 01

2

එස්ඒ-සී

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	ආයතන	නැවත සලසන ලද
	2021	2020
	රු.	රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ඖෂධ, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	23,394,546	118,598,206
වෙනත් ආදායම් ශීර්ෂ වෙතුවෙන් එකතු කරන ලද ආදායම්	-	21,927,407
අග්‍රිම ලැබීම්	2,416,228,000	1,391,263,163
අත්තිකාරම් අයකර ගැනීම්	33,860,852	34,027,508
තැන්පතු ලැබීම්	543,336,048	113,582,496
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	3,016,819,246	1,679,398,780
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනාඩි හා මෙහෙයුම් වියදම්	860,358,860	847,409,710
සහනාධාර සහ මාරුකිරීම්	736,115,012	4,780,150
වෙනත් වැය ශීර්ෂ වෙතුවෙන් දරන ලද වියදම්	104,907,372	438,814,927
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	161,567,577	1,136,016
අත්තිකාරම් ගෙවීම්	32,781,115	33,991,050
තැන්පතු ගෙවීම්	439,492,016	123,409,773
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	2,335,221,952	1,449,541,626
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	681,597,294	229,857,154
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම්	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	681,597,294	230,993,169
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	681,597,294	230,993,169
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	(681,597,294)	(230,993,169)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	(1,136,015)
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඒ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(එ)-(ඒ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	(1,136,015)
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	1,136,015

වාර්තාකිරීමේ පදනම

1) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2021 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩිදියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවායේ බදු වන කාලසීමාව නොසළකා, ගිණුම් කාලසීමාව තුළ මුදල් ලැබීම් අනුව හඳුනාගනු ලැබේ.

4) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම් දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම් වේ.

6) මුදල් හා මුදල් සමාන දෑ

2021 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

ආදයම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
	අදාල නොවේ				

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම (රු.)	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය (රු.)	අවසාන ප්‍රතිපාදනය (රු.)		
පුනරාවර්තන	1,652,840,000.00	2,569,050,000.00	1,755,137,913.45	68%
ප්‍රාග්ධන	1,550,350,000.00	1,945,185,000.00	1,528,603,715.04	78%

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
01	වන ජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය	වන ජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය සඳහා කාර්යාල ඉඩකඩ පහසුකම් ලබා ගැනීම.	97,775,679.00	97,775,679.00	97,775,679.00	100%

02	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව	විශ්‍රාම ගිය නිලධාරී න්ගේ ණය ශේෂ පියවීම වෙනුවෙන්	923,053.00	923,053.00	923,053.00	100%
03	මුදල් හා ප්‍රාග්ධන වෙළඳපොළ හා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශය	අංක 2248/35 හා 2021.10.06 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය අනුව මුදල් හා ප්‍රාග්ධන වෙළඳපොළ හා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශය ඉවත් කර එහි සියලු කටයුතු සිදු කිරීම මුදල් අමාත්‍යාංශය ට පැවරීම.	44,760,470.18	44,760,470.18	6,208,640.04	14%

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

වත්කම් කේතය	කේත විස්තරය	**31.12.2021** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	**31.12.2021** දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	-	3,754,904,836.76	-	
9152	යන්ත්‍රෝපකරණ	-	2,215,740,874.49	-	100%
9153	ඉඩම්	-	8,389,900,000.00	-	
9154	අස්පෘශ්‍ය වත්කම්	-	44,238,020.09	-	
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	
9160	කෙරීගෙන යන වැඩ	-	-	-	
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ඇමුණුම 01 ලෙස ඉදිරිපත් කර ඇත.

04 පරිච්ඡේදය - කාර්යසාධන දර්ශක

ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100%- 90%	75%-89%	50%- 74%
සැලසුම් කළ දේශීය පුහුණු අවස්ථා සංඛ්‍යාව			√
ලැබුණු විදේශීය පුහුණු අවස්ථා සංඛ්‍යාව	√		
ලැබුණු විදේශීය නිවාඩු අයදුම්පත් සංඛ්‍යාව	√		
රාජ්‍ය සේවා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත යොමු කළ විදේශීය නිවාඩු අයදුම්පත් සංඛ්‍යාව	√		
පත් කළ භාණ්ඩාගාර නියෝජිතයන් සංඛ්‍යාව	√		
ඉදිරිපත් කළ කැබිනට් පත්‍රිකා සංඛ්‍යාව	√		

05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.

ඉලක්කය / අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%- 100%
සමාන හා අන්තර්ග්‍රහණීය වූ අධ්‍යාපනයක් ලැබීම තහවුරු හා සැමට ජීවිත කාලය පුරා අධ්‍යාපනය ලැබීමේ අවස්ථා ප්‍රවර්ධනය කිරීම.	අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ දැනුම හා කුසලතා වර්ධනය කර ගැනීමට දේශීය හා විදේශීය පුහුණු පාඨමාලා සඳහා නිලධරයින් යොමු කිරීම.	ලබා දුන් දේශීය හා විදේශීය පුහුණු අවස්ථා සංඛ්‍යාව			√
පුනර්ජනනය වන බලශක්ති ප්‍රභවයන් භාවිතා කිරීම මඟින් දරාගත හැකි විශ්වසනීය තිරසර හා නූතන බලශක්තිය සඳහා ප්‍රවේශය සැමට තහවුරු කිරීම	(i) බලශක්තිය අපතේ යෑම අවම මට්ටමකින් පවත්වා ගැනීම. (ii) අනවශ්‍ය ස්ථානවල ඇති විදුලි බුබුළු නිවා දැමීම				√
කසල හා අපද්‍රව්‍ය බැහැර කිරීමේදී විධිමත්ව වෙන්කර බැහැර කිරීම මඟින් කිරීම භෞමික පරිසර පද්ධති ආරක්ෂා කිරීම, ප්‍රතිස්ථාපනය කිරීම හා පරිසර භාවිතය ප්‍රවර්ධනය කිරීම. වනාන්තර තිරසර ආකාරයෙන් කළමනාකරණය කිරීම, කාන්තාරකරණය වැළැක්වීම, භූමි හායනය නවත්වා එය ප්‍රතිවර්තනය කිරීම හා ජෛව විවිධත්වය අහිමි වීම නැවැත්වීම.	අමාත්‍යාංශයේ කසල හා අපද්‍රව්‍ය බැහැර කිරීමේදී වෙන්කර බැහැර කිරීම මඟින් නැවත භාවිතය හා ප්‍රතිචක්‍රීකරණය යන 3R සංකල්පය ක්‍රියාත්මක කිරීමේ වැඩසටහනට සහයෝගය ලබාදීම				√

06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත)**
ජ්‍යෙෂ්ඨ	47	31	16
තෘතීයික	07	05	02
ද්විතීයික	145	122	23
ප්‍රාථමික	171	151	20

6.2 **ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

ආයතනයේ සේවා අවශ්‍යතාවයන් පවතින සේවක සංඛ්‍යාව මගින් කළමනාකරණය කරගන්නා ලදී.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (Rs'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය)	නිමැවුම/ ලබා ගත් දැනුම*
			දේශීය	විදේශීය		
Diploma in Diplomacy and World Affairs	01	වසර 01	60,000		දේශීය	
Masters of Business Administration - 2021	01	වසර 02	595,000		දේශීය	

* කොවිඩ් 19 වෛරස් තත්ත්වය හේතුවෙන් පුහුණු වැඩසටහන් පැවැත්වීම හා සහභාගීත්වය වෙනත් වර්ෂයන්ට සාපේක්ෂව අවම වී ඇති බැවින් ඉහත දිගුකාලීන පුහුණු පාඨමාලා සඳහා පමණක් ඉල්ලුම් කර ඇති පුහුණුලාභීන් සහභාගී වී ඇත.

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාල නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාල නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාල නොවේ		
1.6	වෙනත්	-		
2	පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		

2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3	මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	වාර්ෂික සැලසුම් සකස් කිරීම			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
5	විගණන විමසුම්			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	අභ්‍යන්තර විගණනය			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව,	අනුකූල වේ		

	අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම			
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	විගණන හා කළමනාකරණ කමිටු			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුල පවත්වාගෙන තිබීම.	අනුකූල වේ	කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් අංක DAM/AMC/M/2021/2 හා 2021.09.06 දිනැතිව නිකුත් කරන ලද "2021 වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම" යන ලිපියට අනුව ගෝලීය covid – 19 වසංගතය නිසා රට තුල ඇති වූ තත්වය හේතුවෙන් කාර්තුවට එක බැගින් වර්ෂයකට විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04ක් පැවැත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කර ඇත. ඒ අනුව 2021 වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු 03ක් පවත්වා ඇත.	
8	වත්කම් කළමනාකරණය			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	වාහන කළමනාකරණය			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූල වේ		
10	බැංකු ගිණුම් කළමනාකරණය			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අදාල නොවේ		

10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	ප්‍රතිපාදන උපයෝජනය			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට ඵලඹීම	අනුකූල වේ		
12	රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්			
12.1	සීමාවන්ට වලට අනුකූල වීම.	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	පොදු තැන්පත් ගිණුම			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	අග්‍රිම ගිණුම			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	ආදායම් ගිණුම			

15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අදාල නොවේ		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අදාල නොවේ		
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අදාල නොවේ		
16	මානව සම්පත් කළමනාකරණය			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	මහජනයා වෙත තොරතුරු ලබා දීම			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ.		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය	අනුකූල වේ.		

	සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම			
19	මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ.		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ.		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ.		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ.		
20	විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. IPD/B/MOF/02/21/35

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2022 ජූනි 14 දින

ඇමුණුම 01
Annexure 01
இணைப்பு I

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

ශීර්ෂය 102 - මුදල් අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය 102 - මුදල් අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මුදල් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මුදල් අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට මුදල් අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ .

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය. ජාතික විගණන පනතේ 38(1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක

සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 අග්‍රිම කළමනාකරණය

සැලසුම් කළ පරිදි අදාල කාර්යයන් ඉටු කිරීම සඳහා 2021 වර්ෂයේදී අමාත්‍යාංශය විසින් එකතුව රු. මිලියන 2,881 ක් අග්‍රිම භාණ්ඩාගාරයෙන් ඉල්ලුම් කර තිබුණ ද, භාණ්ඩාගාරය විසින් එකතුව රු. මිලියන 2,416 ක අග්‍රිම පමණක් ලබා දී තිබුණි. ඒ අනුව, ඉල්ලුම් කළ අග්‍රිමයෙන් රු. මිලියන 465 ක අග්‍රිම අඩුවෙන් ලැබී තිබුණි.

2.2 ව්‍යදම් කළමනාකරණය

2.2.1 ප්‍රතිපාදන නිෂ්ඵල වීම

වැය විෂයයන් 32 ක් සඳහා එකතුව රු. 57,190,000 ක ශුද්ධ ප්‍රතිපාදන සලසා තිබුණත්, සමාලෝචිත වර්ෂයේදී එම ප්‍රතිපාදනවලින් කිසිදු උපයෝජනයක් නොකිරීම නිසා මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

2.2.2. අධි ප්‍රතිපාදන සැලසීම

වැය විෂයයන් 67 ක් සඳහා රු.1,988,505,300 ක අධි ප්‍රතිපාදනයක් සලසා තිබුණු අතර, ඉන් රු.859,389,689 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු. 1,129,115,610 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. ඉතිරිය සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 11 ක සිට සියයට 99 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

2.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගෙවීම හා පියවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ 05 ක සිට වර්ෂ 17 ක කාල පරාසයක සිට සේවය අතහැර ගිය නිලධාරීන් 05 දෙනෙකුගේ හිඟ හිටි රු. 556,141ක ණය ශේෂ සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(ආ) ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අංශයට අනුයුක්තව සිටි නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ එකතුව රු. 4,145,643.40 ක් විය. සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම ණය ශේෂ අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

(ඇ) මුදල් හා ප්‍රාග්ධන වෙළඳපල සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශයේ සේවය අතහැර ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු මාස 03 ක් ඉක්මවූ රු.170,563 ක ණය ශේෂයක් විය. එම ණය ශේෂය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර ගැනීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 ප්‍රගතිය ඉදිරිපත් කර නොකිබීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් අමාත්‍යාංශයේ 2021 වර්ෂයට අදාල ක්‍රියාකාරී සැලැස්ම අනුව පහත සඳහන් අරමුණු ඉටු කර ගැනීමට අදාල ක්‍රියාකාරකම් සිදු කිරීමට අපේක්ෂා කර තිබුණි.

(i) භාණ්ඩාගාර දෙපාර්තමේන්තුවල සාර්ව මූල්‍ය මෙහෙයුම් තහවුරු කර ගැනීම

(ii) වෙළඳ ආශ්‍රිත ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සැලසීම හා යහපාලනය වැඩිදියුණු කිරීම

(iii) රාජ්‍ය ආයෝජන සඳහා පහසුකම් සැලසීම, වත්කම් කළමනාකරණයේ හා මානව සම්පත් කළමනාකරණයේ උපරිම උපයෝජනය තහවුරු කිරීම

(iv) කාර්ය මණ්ඩලය සඳහා පුහුණුව ලත් මානව සම්පත් සංවර්ධනය තහවුරු කර ගැනීම

(v) ගිණුම් කටයුතු භාවය හා යහපාලනය තහවුරු කර ගැනීම

ඉහත සඳහන් අරමුණු ඉටු කිරීමේ ප්‍රගතිය පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

3.1.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

මුදල් අමාත්‍යාංශය යටතේ දේශීය අරමුදල්/ විදේශ ණය/ ආධාර යොදවා ක්‍රියාත්මක කරන සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතිය (SSNP) සඳහා සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 8 ක ප්‍රතිපාදන සලසා තිබුණි. එමෙන්ම, මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතිය (FSMP) සඳහා එකතුව රු. මිලියන 489 ක ප්‍රතිපාදන සලසා තිබුණි. එම ව්‍යාපෘතිවල කාර්යසාධනය මන්දගාමී ස්වරූපයක් ගැනීම හේතුවෙන් සමාජ ආරක්ෂණ ජාල ව්‍යාපෘතිය (SSNP) සඳහා සලසා තිබුණු ප්‍රතිපාදන සියයට 65 ක් හෙවත් රු. මිලියන 5.2 ක ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. මූල්‍ය අංශ නවීකරණ ව්‍යාපෘතිය (FSMP) සඳහා සලසා තිබුණු එකතුව රු.මිලියන 489 ක ප්‍රතිපාදනවලින් එම ව්‍යාපෘතිය වෙනුවෙන් කිසිදු උපයෝජනයක් නොකර, රු. මිලියන 313 ක ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබුණු බව නිරීක්ෂණය විය.

3.2 ප්‍රසම්පාදනයන්

(අ) ප්‍රසම්පාදනයන් සැලසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (අ) හා (ආ) මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් අවම වශයෙන් වසර තුනක (03) කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුළත් කරමින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කල යුතු වුවද, අමාත්‍යාංශය එවන් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙළ කර නොතිබුණි.

(ii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ඇ) මාර්ගෝපදේශය ප්‍රකාරව එළඹෙන වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන කටයුතු විස්තරාත්මකව පිළියෙල කරනු ලැබිය යුතු වුවද, අමාත්‍යාංශය විසින් 2021 වර්ෂයට අදාල විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්ම, එම වර්ෂය අවසන් වූ පසු 2022 ජනවාරි 19 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

(ආ) **භාණ්ඩාගාර පැරණි ගොඩනැඟිල්ලේ මධ්‍ය වායු සමන පද්ධතිය සඳහා නව ශීතකරණ යන්ත්‍රයක් (Chiller Machine) සපයා සවිකිරීම**

මහා භාණ්ඩාගාර පැරණි ගොඩනැඟිල්ලේ මධ්‍යම වායු සමන පද්ධතිය සඳහා නව ශීතකාරක යන්ත්‍රයක් (Chiller Machine) සපයා සවිකිරීම සඳහා ජාතික තරඟකාරී ප්‍රසම්පාදන ක්‍රමය යටතේ සැපයුම්කරු ලෙස පෞද්ගලික සමාගමක් තෝරාගෙන ඒ සඳහා 2020 වර්ෂයේ හා 2021 වර්ෂයේදී එකතුව රු.25,464,689 (බදු සහිත) ක් අදාල කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි. ඒ පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2019 අගෝස්තු 23 දින ප්‍රථම වතාවට රැස් වූ ප්‍රසම්පාදන කමිටුව විසින් මෙම ප්‍රසම්පාදන සඳහා උපදේශන සේවය, ලංකා විදුලිබල මණ්ඩලය වෙතින් ඉටුකර ගැනීමට තීරණය කර තිබුණි. ඒ අනුව පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කිරීම හා ලංසු ලේඛන සකස් කිරීමේ කටයුතු ඉටුකර වෙනුවෙන් ලංකා විදුලිබල මණ්ඩලය විසින් රු.897,000 ක උපදේශන ගාස්තු ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණි

පිරිවැය ඇස්තමේන්තු සකස් කිරීමේදී හැකිතාක් නිවැරදිව පිළියෙල කිරීමට වගබලා ගත යුතු වුවද, උපදේශන සේවා ආයතනය ලෙස තෝරාගත් ලංකා විදුලිබල මණ්ඩලය විසින් මෙම ප්‍රසම්පාදනයේ පිරිවැය ඇස්තමේන්තුව ලෙස එකතුව රු.34,000,000 (බදු රහිත) ක් ඉදිරිපත් කර තිබුණු අතර එය ප්‍රසම්පාදන කමිටුව විසින්ද අනුමත කර තිබුණි. ඒ අනුව අදාල කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කර තිබුණු මිල වන රු.23,666,049 (බදු රහිත) හා සැසඳීමේදී පිරිවැය ඇස්තමේන්තුව රු. 10,333,951 කින් හෙවත් සියයට 30 කින් වැඩි වී තිබුණි.

(ii) 2019 අගෝස්තු 23 දින මෙම ප්‍රසම්පාදනය කටයුතු ආරම්භ කර තිබුණු අතර 2020 ජූලි 10 දින රැස් වූ ප්‍රසම්පාදන කමිටුව විසින් මෙම සැපයුම් කොන්ත්‍රාත්තුව සඳහා UL (Registered by Underwriters Laboratories) සහතිකය අත්‍යාවශ්‍ය බව සඳහන් කර තෝරාගත් කොන්ත්‍රාත්කරු හට එම සහතිකය නොමැති බැවින් නැවත ප්‍රසම්පාදනය සිදුකළ යුතු බව තීරණය කර තිබුණි. පසුව මෙම සහතිකය අවශ්‍ය නොවන බව ප්‍රසම්පාදන කමිටු තීරණය මත සකස් කළ අතිරේක සටහනක් (Addendum 1) මගින් දක්වා, නැවත විවෘත කළ මිල ගණන් යටතේ

ලංසු කැඳවා ඉහත සැපයුම් කොන්ත්‍රාත්කරු තෝරාගෙන තිබුණි. ප්‍රසම්පාදන තීරණ ගැනීමේදී හැකිතාක් නිවැරදිව හා නොපමාව ගැනීමට කටයුතු කළ යුතු වුවද, මෙහිදී එසේ සිදු නොකිරීම නිසා මෙම ප්‍රසම්පාදනය සම්බන්ධව පළමුවෙන්ම පළ කරන ලද සුචක්පත් දැන්වීම සඳහා වැය කරන ලද රු. 198,045 ක මුදල අනාර්ථික වී තිබුණි.

(iii) 2019 අගෝස්තු 23 දින මෙම ප්‍රසම්පාදනය කටයුතු ආරම්භ කර, 2020 සැප්තැම්බර් 18 දින ඉහත කොන්ත්‍රාත්කරු වෙත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. ඒ අනුව, මෙම ප්‍රසම්පාදනය සඳහා සැපයුම් කොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගැනීමට වර්ෂ 01 දින 26 ක දීර්ඝ කාලයක් ගතවී තිබුණි.

(ඇ) පාර්ලිමේන්තු කටයුතු අංශය සඳහා ඡායා පිටපත් යන්ත්‍රයක් මිලදී ගැනීම.

මුදල් අමාත්‍යාංශයේ පාර්ලිමේන්තු කටයුතු අංශය සඳහා ඡායාපිටපත් යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා සීමිත මිල ගණන් යටතේ පෞද්ගලික සමාගමක් විසින් ඉදිරිපත් කරන ලද රු. 1,539,000 (බදු සහිත) ක ලංසුව තෝරාගෙන, 2021 වර්ෂයේදී එම කොන්ත්‍රාත් වටිනාකම මත කොන්ත්‍රාත්කරු වෙත ගෙවීම් කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඉහත යන්ත්‍රය මිලදී ගැනීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශය අනුව සකස් කළ ලංසු ලේඛනවල 2.7 වගන්තිය අනුව කොන්ත්‍රාත් මුදලින් සියයට 5 ක් වූ මුදලක් සැපයුම් කොන්ත්‍රාත්තුව අවසන් වී දින 28 ක් ඔබ්බට වූ දිනය වන තුරු කාර්යසාධන සුරක්ෂණ ඉදිරිපත් කළ යුතු වුවද, මෙම කොන්ත්‍රාත්තුව සම්බන්ධව එසේ කාර්යසාධන සුරක්ෂණ ලබා ගෙන නොතිබුණි.

(ii) තෝරාගත් කොන්ත්‍රාත්කරු හට 2021 මැයි 20 දින මිලදී ගැනීමේ ඇනවුම් සිදුකර තිබුණද, සැපයුම් කාල පරිච්ඡේදය හා යන්ත්‍රය පිළිබඳ වගකීම් කාලය ඇතුළත් කොන්දේසි සහිතව කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුම්ගත වී නොතිබුණි.

(iii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 හා 4.2.3 ප්‍රකාරව ප්‍රසම්පාදනයක් ආරම්භවීමේ අවස්ථාවේ සිට අවසන් කරන තුරු එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවන්හි පියවර පිළිබඳ විස්තර කර අදියර 02 ක් යටතේ

ප්‍රසම්පාදන කාලසටහනක් පිළියෙල කර නොතිබුණි. ප්‍රසම්පාදනය 2021 පෙබරවාරි 18 දින ආරම්භ කර මාස 06 දින 24 ක කාල පමාවකට පසුව අදාල යන්ත්‍රය 2021 සැප්තැම්බර් 14 දින සපයා තිබුණි.

(iv) ප්‍රසම්පාදනය යටතේ 2021 සැප්තැම්බර් 14 දින අමාත්‍යාංශය වෙත ලැබුණු ඡායා පිටපත් යන්ත්‍රය සඳහා අදාල සැපයුම් කොන්ත්‍රාත්කරු හට මුදල් ගෙවීමට ප්‍රථම අදාල පිරිවිතරවලට අනුකූලද යන්න පිළිබඳව තාක්ෂණික නිලධාරියෙකුගේ සහතිකයක් ලබාගෙන නොතිබුණි.

(v) සැපයුම් කොන්ත්‍රාත්තුවට අදාලව ලංසු ලේඛනවල සඳහන් වූ කොන්දේසි යටතේ නියමිත දිනට අදාල සැපයුම සිදුකිරීමට කොන්ත්‍රාත්කරු අපොහොසත් වුවහොත් ප්‍රමාදවන සෑම දිනක් වෙනුවෙන් කොන්ත්‍රාත් මුදලින් සියයට 0.05 කට සමාන මුදලක් අඩුකරගත යුතු බව දක්වා තිබුණි. මෙම සැපයුම් කොන්ත්‍රාත්තුවට අදාල ඇණවුම 2021 මැයි 21 දින සිදුකර මාස 06 දින 24 ක කාලයකට පසුව සැපයුම සිදුකර තිබුණද, මෙම සැපයුම් කොන්ත්‍රාත්තුව සම්බන්ධව සැපයුම් කාල පරිච්ඡේදය දක්වා ගිවිසුම්ගත වී නොතිබුණු බැවින් ඉහත කොන්දේසිය පරිදි ප්‍රමාද අලාභ අයකරගැනීමට නොහැකි වී තිබුණි.

(ඇ) ආයතනික අංශය හා ගිණුම් අංශය සඳහා ඡායා පිටපත් යන්ත්‍ර 02 ක් මිලදී ගැනීම.

මුදල් අමාත්‍යාංශයේ ආයතනික අංශය හා ගිණුම් අංශය සඳහා ඡායා පිටපත් යන්ත්‍ර 02 ක් මිලදී ගැනීම සඳහා සීමිත මිල ගණන් යටතේ පෞද්ගලික ආයතනයක් විසින් ඉදිරිපත් කරන ලද එක් යන්ත්‍රයක මිල රු. 475,000 (බදු සහිත) ක් වශයෙන් යන්ත්‍ර 02 ක් සඳහා රු.950,000 ක ලංසුව තෝරාගෙන 2021 වර්ෂයේදී එම මුදල ඉහත කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මෙම ඡායා පිටපත් යන්ත්‍ර මිලදී ගැනීමට අදාල ප්‍රසම්පාදන කටයුතු 2021 මාර්තු 22 දින ආරම්භ කර අමාත්‍යාංශය වෙත මාස 05 දින 12 ක් ප්‍රමාද වී 2021 සැප්තැම්බර් 03 දින අදාළ යන්ත්‍ර ලබාගෙන තිබුණි. එසේම මෙම ප්‍රසම්පාදනය

ඉටු කර ගැනීමේදී රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව ප්‍රසම්පාදන කාලසටහන් පිළියෙල කර නොතිබුණි.

(ii) මෙම සැපයුම් කොන්ත්‍රාත්තුවට අදාලව ලංසු ලේඛනවල සඳහන් වූ කොන්දේසි යටතේ නියමිත දිනට අදාල සැපයුම් සිදුකිරීමට කොන්ත්‍රාක්කරු අපොහොසත් වුවහොත් ප්‍රමාදවන සෑම දිනක් වෙනුවෙන් කොන්ත්‍රාත් මුදලින් සියයට 0.05 කට සමාන මුදලක් අඩුකරගත යුතු බව දක්වා තිබුණි. එම සැපයුම් කොන්ත්‍රාත්තුවට අදාල ඇණවුම 2021 ජූනි 01 දින සිදුකර මාස 03 දින 02 කට පසුව 2021 සැප්තැම්බර් 03 දින සැපයුම සිදුකර තිබුණද, එම සැපයුම් කොන්ත්‍රාත්තුවට සම්බන්ධ සැපයුම් කාල පරිච්ඡේදය හා අදාල කොන්දේසි දක්වා ගිවිසුම්ගත වී නොතිබුණු බැවින් ඉහත කොන්දේසිය පරිදි ප්‍රමාද අලාභ අයකරගැනීමට නොහැකි වී තිබුණි.

(iii) මෙම ප්‍රසම්පාදනය යටතේ 2021 සැප්තැම්බර් 03 දින අමාත්‍යාංශය වෙත ලැබුණු ඡායා පිටපත් යන්ත්‍ර 02 ක් සඳහා අදාල සැපයුම් කොන්ත්‍රාක්කරු හට මුදල් ගෙවීමට ප්‍රථම අදාල පිරිවිතරවලට අනුකූලද යන්න පිළිබඳව තාක්ෂණික නිලධාරිනියෙකුගේ සහතිකයක් ලබාගෙන නොතිබුණි.

3.3 වාහන කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශය සතු වාහන 28 ක්, රාජ්‍ය අමාත්‍ය කාර්යාලය, දෙපාර්තමේන්තු, සංස්ථා, හා වෙනත් ආයතන වෙත නිදහස් කර තිබුණත්, ඒවා විධිමත් පරිදි පවරා දී නොතිබුණි.

(ආ) වෙනත් ආයතන වෙතින් අමාත්‍යාංශය වෙත විධිමත් පවරා ගැනීමකින් තොරව වාහනයක් ලබා ගෙන තිබුණි.

4. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2021 දෙසැම්බර් 31 දින වන විට අමාත්‍යාංශයේ සමස්ථ පුරප්පාඩු සංඛ්‍යාව 63 ක් වී තිබුණි. ඒ තුළ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 18 ක් විය.

(ආ) මුදල් අමාත්‍යාංශයෙන් වැටුප් ගෙවමින් වෙනත් ආයතනවල සේවය සඳහා නිදහස් කරන ලද නිලධාරීන් 10 දෙනෙකු සඳහා 2021 දෙසැම්බර් 31 දිනට වැටුප් හා දීමනා ලෙස එකතුව රු. 4,303,272 ක් ගෙවා තිබුණි.

ඩී.ඒ.ඒ. වනිගසේකර
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට